**අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදල - 2016**

---------------------------------------------------------

අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2007 ජූලි 17 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 22 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2007 ජුලි 17 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 18 වගන්තිය | භාරකරුවන්ගේ රැස්වීම් අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (ආ) ඡේදය | 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අතිරික්ත මුදල් රු.6,101,640 ක් හා 2015 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අතිරික්ත මුදල් රු.3,258,965 ක් ඒකාබද්ධ අරමුදලට මාරු කළ යුතු නමුත් ඒ වෙනුවට එම අතිරික්ත මුදල් පිළිවෙලින් අරමුදලේ ජංගම ගිණුමක හා මාසිකව කල්පිරෙන පරිදි ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,258,944 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,354,321 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,904,623 ක වර්ධනයක් දැක්වුණි. රජයේ ප්‍රදාන රු.5,000,000 කින් අඩුවී තිබුණද, යටිතල පහසුකම් නඩත්තු වියදම් රු.8,769,461 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

4.1 කාර්යසාධනය
---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 ජූලි 17 දිනැති භාරකාර ඔප්පුවක් මගින් අරමුදල ස්ථාපිත කර තිබුණු අතර භාරකාර ඔප්පුවේ 1(A) වගන්තිය අනුව අධිකරණ නිල නිවාස, ලේඛණාගාර, නඩුභාණ්ඩ කාමර, විනිසුරුවරුන්ගේ කාමර, රෙජිස්ටාර් කාර්යාල, නඩුකාරවරුන්ගේ පුස්තකාල සහ ඉහත පරිශ්‍රයන්ට අදාළ පොදු ස්ථාන වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීමත් ඉහත පරිශ්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණ පහසුකම්, කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ සැපයීමත් ප්‍රධාන කාර්යයන් විය. මෙම කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.10,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් රු.3,575,096 ක් වැය කර පරිගණක උපාංග සහ කාර්යාල උපකරණ සැපයීම පමණක් සිදුකර තිබුණු අතර අනෙකුත් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(ආ) අධිකරණ අමාත්‍යාංශයේ අධිකරණ පරිපාලනය වැය ශීර්ෂ 228 න් එහි ප්‍රධාන කාර්යයක් වූ අධිකරණවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.1,211,902,087 ක් වැය කර තිබියදී එම කාර්යයන් සඳහාම අධිකරණ අමාත්‍යාංශ වැය ශීර්ෂ 110 න් මෙම අරමුදල සඳහා රු.10,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------

5.1 ක්‍රියාකාරී සැලැස්ම
--------------------

අරමුදලේ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඒ සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර එය ක්‍රියාත්මක කරද නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය
-------------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කාර්යයන් පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.3 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අරමුදල ආරම්භකර තිබූ 2009 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.